# FOREIGN FINANCE
# (Part-VIII)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# බහු පාර්ශ්වීය මූල්‍ය ආයතන

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව ශක්තිමත් කොට ලෝක වෙළෙඳාම වර්ධනය කිරීමත් විනිමය අනුපාතිකයන්හි ක්‍රමවත් භාවයක් ඇති කිරීමත් අරමුණු කර ගනිමින් ලෝකයේ රටවල් එකතු වී පිහිටුවා ගෙන ඇති මූල්‍ය ආයතන බහු පාර්ශ්වීය මූල්‍ය ආයතන යනුවෙන් හඳුන්වයි.

# ප්‍රධාන බහු පාර්ශ්වීය මූල්‍ය ආයතන

- අන්තර්ජාතික මූල්‍ය අරමුදල
- ලෝක බැංකුව

ClassWork.LK

# අන්තර්ජාතික මූල්‍ය අරමුදල

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව, විනිමය අනුපාතිකයන්හි ස්ථාවරත්වය සහ විනිමය අනුපාතිකයන්හි විධිමත්භාවය ප්‍රවර්ධනය කිරීම සඳහාත්, ආර්ථික වෘද්ධිය හා සේවා නියුක්ත මට්ටම් වර්ධනය කිරීමටත්, ගෙවුම් ශේෂ ගැළපීම් පහසු කරලීම සඳහාත්, 1945 දෙසැම්බර් 27 දින අන්තර්ජාතික මූල්‍ය අරමුදල ආරම්භ කර ඇත.

අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ ආරම්භක සාමාජිකයන් සංඛ්‍යාව 29ක් වන අතර වර්තමාන සාමාජික සංඛ්‍යාව 186කි.

ClassWork LK

# අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ අරමුණු

- ජාත්‍යන්තර මූල්‍ය ගැටලුවල දී උපදේශන සහ සහයෝගීතාව ලබා දෙන ස්ථිර ආයතනයක් පිහිටුවීම මගින් මූල්‍ය සහයෝගීතාව වර්ධනය කිරීම.

- සියලුම සාමාජික රටවල නිෂ්පාදන සම්පත් සංවර්ධනය කිරීමටත්, ඉහළ සේවා නියුක්තයක් හා මූර්ත ආදායමක් පවත්වා ගෙන යාමටත්, අන්තර් ජාතික වෙළෙඳාමේ සමබර වර්ධනයටත ්, අවශ්‍ය පහසුකම් සැපයීමටත්, සංවර්ධන රටවල් අතර විනිමය අනුපාතියන් ක්‍රමවත් ව පවත්වා ගෙන යමින් විනිමය අනුපාතිකයන්හි ස්ථාවර භාවයක් ඇති කිරීම.

- සාමාජික රටවල වර්තන ගනුදෙනු සම්බන්ධයෙන් බහු පාර්ශ්වීය ගෙවීම් ක්‍රමයක් ස්ථාපිත කිරීම හා අන්තර් ජාතික වෙළෙඳාමේ වර්ධනයට බාධා පමුණුවන විදේශ විනිමය සීමාවන් ඉවත් කිරීම.

- ගෙවුම් ශේෂයේ ගැළපුම ඇති කර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් සාමාජික රටවලට තාවකාලික ව ලබා දීම.

- සාමාජික රටවල ගෙවුම් ශේෂ අසමතුලිතතා සහ එම අසමතුලිතතා පවතින කාලය අඩු කිරීම.

ClassWork.LK

# අන්තර් ජාතික මූල්‍ය අරමුදලේ කාර්යයන්

- ජාතික ආර්ථිකයන් හා ලෝක ආර්ථිකයන් අනතුරුදායක තත්වයන්ට පත් වන අවස්ථාවල දී නිවැරදි මඟට යොමු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.

- බැංකු හා මූල්‍ය කටයුතුවල ගුණාත්මක භාවය ඇති කිරීම සඳහා අවශ්‍ය නීතිරීති පවත්වා ගෙන යාමට උපදෙස් ලබා දීම.

- හදිසි මූල්‍ය අර්බුදවල දී සාමාජික රටවලට තාවකාලික ණය පහසුකම් ලබා දීම, දිගු කාලීන ආර්ථික ගැටලුවල දී මූල්‍ය පහසුකම් ලබා දීම හා ආර්ථික ප්‍රතිසංස්කරණ ඇති කොට විසඳුම් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම.

- සාමාජික රටවලට තාක්ෂණික සහයෝගීතාව ලබා දීම හා රජයේ හා මහ බැංකු නිලධාරීන් පුහුණු කිරීම.

- සාමාජික රටවල් අතර රාජ්‍ය මූල්‍ය, විදේශ මූල්‍ය හා ජාතික ගිණුම් වැනි අංශ සම්බන්ධ ප්‍රමිති සැකසීම හා ඒ අනුව තොරතුරු ප්‍රකාශයට පත් කිරීම මගින් අන්‍යෝන්‍ය අවබෝධය හා අධ්‍යාපනය සාමාජික රටවල් අතර බෙදා හැරීම

ClassWork.LK

# ලෝක බැංකුව

ඇමරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය ඇතුළු රටවල් 42 ක සහභාගිත්වයෙන් 1944 ජූලි මාසයේ දී ඇමරිකා එක්සත් ජනපදයේ බ්‍රෙටින්වුඩ්ස් නගරයේ පැවති බ්‍රෙටින්වුඩ්ස් සමුළුවේ ප්‍රතිපලයක් ලෙස දෙවන ලෝක සංග්‍රමයෙන් විනාශයට පත් වූ යුරෝපා රටවල් යළි පුනරුත්ථාපනය කිරීමේ අරමුණෙන් 1947 මාර්තු 01 දින ලෝක බැංකුව පිහිටුවා ඇත.

1946 වර්ෂයේ ව්‍යාපාරික කටයුතු ආරම්භ කළ ලෝක බැංකුවේ ආරම්භක සාමාජික සංඛ්‍යාව 38කි.

වර්තමානය වන විට ලෝකයේ රටවල් 186 ක් මෙහි සාමාජිකත්වය දරයි.

**ලෝක බැංකුව ප්‍රධාන ආයතන දෙකකින් සමන්විත වේ.**

- ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික බැංකුව
- අන්තර්ජාතික සංවර්ධන සංගමය

ClassWork.LK

## ලෝක බැංකුවේ අරමුණු

- සාමාජික රටවල නිෂ්පාදන කටයුතු සඳහා අන්‍යෝන්‍ය පහසුකම් සැපයීම මගින් එම රටවල ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම

- සාමාජික රටවලට ලිහිල් කොන්දේසි මත විදේශ ප්‍රාග්ධනය නොලැබෙන විට විදේශ පෞද්ගලික ආයෝජන දිරි ගැන්වීම් සඳහා අවශ්‍ය පහසුකම් හා අවස්ථා ඇති කිරීම

- පෞද්ගලික ආයෝජනවලට අමතරව බැංකුවේ අරමුදල් හා වෙනත් මාර්ගවලින් ලබා ගන්නා අරමුදල් ද භාවිත කරමින් සාමාජිත රටවල ඵලදායි නිෂ්පාදන කටයුතු සඳහා දිගු කාලීන ණය සැපයීම

- සාමාජික රටවලට කාර්මික හා ශිල්පීය උපදෙස් සේවා ලබා දීම

- සාමාජික රටවල නිෂ්පාදන සම්පත් වර්ධනය කිරීම මගින් හා අන්තර්ජාතික ආයෝජන දිරි ගැන්වීම මගින් අන්තර්ජාතික වෙළෙඳාමේ සමබර වර්ධනයක් ඇති කිරීම

- ලෝකයේ දිළිඳු බව අඩු කිරීම

ClassWork.LK

## ලෝක බැංකුවේ කාර්යයන්

- සාමාජික රටවලට මූල්‍ය හා තාක්ෂණික ආධාර සැපයීම

- සාමාජික රටවලට සහනදායී කොන්දේසි යටතේ ණය ලබා දීම

- විදේශ ආයෝජන ගෙන්වා ගැනීම සඳහා සාමාජික රටවලට අවශ්‍ය සහයෝගය ලබා දීම

- සාමාජික රටවල සංවර්ධනය වේගවත් කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති සැලසුම් කිරීමට හා අධීක්ෂණය කිරීමට ලෝක බැංකු විශේෂඥයන්ගේ සහයෝගය ලබා දීම

- තිරසර සංවර්ධනය ඇති කිරීම සඳහා ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමටත්, ආර්ථික ඵලදායිතා ඉහළ නැංවීමටත්, පරිසරය ආරක්ෂා කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර සහයෝගීතාව ගොඩ නැංවීමටත් කටයුතු කිරීම.

ClassWork.LK

- සාමාජික රටවලට ගෝලීයකරණ ගමන් මගට පිවිසීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම

- ලෝක වෙළෙඳපොළේ මුහුණපෑමට සිදු වන අවාසිදායක තත්ත්වයන් සමනය කර ගැනීම සඳහා සාමාජික රටවලට අවශ්‍ය ආධාර සැපයීම.

- ලෝක ප්‍රජාව සමග යහපත් සම්බන්ධතා ගොඩ නගා ගැනීම සඳහා සහයෝගය ලබා දීම.

- නව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සාමාජික රටවලට අවශ්‍ය සහයෝගය ලබා දීම.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura